අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/06/05/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2018.03. 23

චක්‍රලේඛ අංක - 33/2017(i)

සියලු ම පළාත් ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ. වරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජය හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## පාසල් වාර සටහන - 2018

පාසල් වාර සටහන - 2018 සම්බන්ධයෙන් 2017.08.31 දිනැති අංක 33/2017 චක්‍රලේඛයේ පහත සඳහන් සංශෝධන සිදු කරනු ලැබේ.

ඒ අනුව උක්ත චක්‍රලේඛයේ 01 ඡේදයේ I හි තෙවන වාරයට ද II හි දෙවන සහ තෙවන වාරවලට ද අදාළව පවත්වනු ලබන කාලසීමාවන් සහ 2.1 උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. සිංහල හා දෙමළ පාසල් සඳහා

| | |
|---|---|
| පළමුවන වාරය | වෙනස් නොවේ. |
| දෙවන වාරය | වෙනස් නොවේ. |
| තෙවන වාරය | 2018 සැප්තැම්බර් මස 03 වන සඳුදා සිට 2018 නොවැම්බර් මස 30 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

II. මුස්ලිම් පාසල් සඳහා

| | |
|---|---|
| පළමුවන වාරය | වෙනස් නොවේ. |
| දෙවන වාරය | <u>පළමු වන අදියර</u><br>2018 අප්‍රේල් මස 18 වන බදාදා සිට 2018 මැයි මස 14 වන සඳුදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| | (රාමසාන් උපවාසය සඳහා 2018.05.15 සිට 2018.06.17 දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ.) |
| | <u>දෙවන අදියර</u><br>2018 ජුනි මස 18 සඳුදා සිට 2018 අගෝස්තු මස 20 සඳුදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| තෙවන වාරය | 2018 අගෝස්තු මස 27 වන සඳුදා සිට 2018 නොවැම්බර් මස 30 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

කරු.අ.පි.බ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் — +94112784832 | +94112784825
ලේකම් / செயலாளர் — +94112784811 | +94112785162

2.1 පාසල් වාර සටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති 97/15 චක්‍රලේඛයට අනුව ලංකාවේ සියලුම පාසල් දින 210 ක් පැවැත්විය යුතු බව අවධාරණය කර ඇතත්, 2018 වර්ෂයට යෙදෙන රජයේ නිවාඩු දිනයන් අනුව දින 210 ක් පාසල් පැවැත්වීමට නොහැකි වී ඇත. එබැවින් 2018 වර්ෂය සඳහා රජයේ හා රජයේ අනුමත සියලු ම පෞද්ගලික පාසල් හා අනුමත පිරිවෙන්, දින 194 පැවැත්විය යුතු වේ.

ඉහත සංශෝධන හැර 33/2017 චක්‍රලේඛයේ සෙසු සියලු විධි විධාන ඒ අයුරින්ම බල පවත්වනු ඇත.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
02. විභාග කොමසාරිස් ජනරාල්
03. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
04. ප්‍රධාන කොමසාරිස් - අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව
05. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්
06. සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
07. සභාපති, මධ්‍යම ගමනාගමන මණ්ඩලය